# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2025 ජනවාරි**

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

ව්‍යාපාර නීතිය (203) ප්‍රශ්න පත්‍රය A,B සහ C ලෙස අනිවාර්ය ප්‍රශ්න 07 ක් සහිතව කොටස් තුනකින් සමන්විත විය. සමස්තයක් ලෙස අයදුම්කරුවන්ගේ ව්‍යාපාර නීති දැනුම ඇගයීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර තිබුණි.

උත්තරපත්‍ර පරීක්ෂාවේදී, ඒ පිළිබඳව උත්තර පරීකෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත පරිදි සාරාංශ කර ඇත:

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 25 ක් සඳහා වාස්තවික ප්‍රශ්න 14 කින් සමන්විත විය.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට බොහොමයක් අයදුම්කරුවන් උත්සාහ දරා තිබුණි. තවද, බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට වෙන් කර ඇති මුළු ලකුණු සංඛ්‍යාවෙන් අඩකට වඩා ලබාගෙන තිබුණි.

ප්‍රශ්න අංක **1.9, 1.11, 1.12, 1.13** සහ **1.14** යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලබා දීමට අයදුම්කරුවන් සැලකිය යුතු පිරිසක් අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. බොහොමයක් අයදුම්කරුවන්ට මූලික අයිතිවාසිකම් නඩු වල අධිකරණ බලය, හිස් පිටසන, විනිමය බිල්පත්, ජාත්‍යන්තර වෙළඳාමේ භාවිතා වන ලේඛණ සහ මිල රක්ෂණ, ගැල් කුලිය (CIF) ගිවිසුම් ආදිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබුණි.

**A කොටස** සඳහා ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා අධිකරණයන්හි අධිකරණ බලය, භාණ්ඩ විකිණීමේ ආඥා පනත, ගිවිසුම් නීතිය, ජාත්‍යන්තර වෙළඳ නීතිය සහ ගනුදෙනු කළ හැකි ලේඛන පිළිබඳ අයදුම්කරුවන්ට හොඳ දැනුමක් තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙය රක්ෂණ නීතිය හා සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි.

**(a)** බොහොමයක් අයදුම්කරුවන් රක්ෂණ හිමිකමේ මූලධර්මය හඳුනාගෙන ඇත. රක්ෂණ හිමිකමක් නොමැති නම් වලංගු රක්ෂණ ගිවිසුමක් ඇති නොවන බව ඇතැම් අයදුම්කරුවන්ට ප්‍රමාණවත් අවබෝධයක් නොතිබුණි. ජීවිත රක්ෂණයේදී, පුද්ගලයෙකුගේ මරණය හේතුවෙන් තවත් පුද්ගලයෙකුට මූල්‍යමය අලාභයක් සිදුවුවහොත්, එම පුද්ගලයාට රක්ෂණ හිමිකමක් ඇති අතර ණයහිමියාට ණයගැතියාගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් තිබෙන අතර එය සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් විසින් හඳුනාගෙන නොමැත.

**(b)** **(i)** සහ **(ii)** යන ප්‍රශ්න රක්ෂණයට අදාළව දී ඇති පද පැහැදිලි කිරීම සඳහා වන ඍජු න්‍යායාත්මක ප්‍රශ්න විය. බොහොමයක් අයදුම්කරුවන් උපරිම විශ්වාසය සහ ආසන්නතම හේතුව යන මූලධර්ම හොඳින් හඳුනාගෙන එම ප්‍රශ්නයට ලකුණු ලබා ගෙන ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් අයදුම්කරුවාගේ බුද්ධිමය දේපළ නීතිය සහ මුදල් විශුද්ධිකරණය පනත පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇති අතර එය සරල න්‍යායාත්මක ප්‍රශ්නයක් විය.

(**a**) මෙම කොටස මගින් වෙළඳ ලකුණු පිළිබඳ විෂය දැනුම පරීක්ෂා කර ඇත. ලියාපදිංචි වෙළඳ ලකුණක හිමිකරුට හිමි අයිතිවාසිකම් සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් හඳුනාගෙන ඇත.

(**b**) මෙම කොටස මගින් පේටන්ට් අයිතිය සම්බන්ධ නීතිය පිළිබඳ විෂය දැනුම පරීක්ෂා කර ඇති අතර බුද්ධිමය දේපළ පනතට අනුව පේටන්ට් අයිතිය හිමිනොවන නව නිපැයුම් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන්ට පේටන්ට් නීතිය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බවත් අදාළ නොවන පිළිතුරු ලබා දී ඇති බවත් නිරීක්ෂණය විය.

(**c**) මෙම කොටස මගින් මුදල් විශුද්ධිකරණ පනත පිළිබඳව සහ මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනතට අනුව හඳුනාගත් නීති විරෝධී ක්‍රියාකාරකම් පරීක්ෂා කර ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

මෙහි ප්‍රශ්න භාණ්ඩ විකිණීමේ ආඥා පනතට සම්බන්ධ වේ.

**(a)** බොහොමයක් අයදුම්කරුවන් "භාණ්ඩ දක්වා ඇති විස්තරයට අනුරූප විය යුතුය" යන ව්‍යංග කොන්දේසිය හඳුනාගෙන ඇත. නමුත් ඍජුව භාණ්ඩ විකිණීමේ ආඥා පනත මත පදනම්ව අයදුම්කරුවන් තම පිළිතුරු ලියනු ඇති බවට අපේක්ෂා කළද, පාරිභෝගික කටයුතු නීතීන් සහ මූලික අයිතිවාසිකම් වැනි නීතිමය සන්දර්භයන් මත පදනම්ව සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් තම පිළිතුරු ලියා ඇති බව නිරීක්ෂණය විය.

**(b)** භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ දක්වා ඇති ව්‍යංග කොන්දේසි බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව දක්වා ඇති අතර සම්පූර්ණ ලකුණු හිමිකරගෙන ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය කම්කරු නීතිවලට අදාළ තරමක් සරල ප්‍රශ්නයකි.

**(a)** සේවකයෙකු සහ ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු අතර වෙනස පිළිබඳව බොහොමයක් අයදුම්කරුවන් දැනුවත් බව නිරීක්ෂණය විය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට උත්සාහ කර සතුටුදායක මට්ටමක පිළිතුරු සපයා තිබුණි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කම්කරු නීතියේ භාවිතා වන පරීක්ෂණ ක්‍රම මත පදනම්ව ක්‍රමානුකූලව පිළිතුර ගොඩනගා ඇත.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට අවබෝධයෙන් පිළිතුරු දුන් බව නිරීක්ෂණය වුවද, සමහර අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සහ පාරිතෝෂික ගෙවීම් හඳුනා ගැනීමේදී ව්‍යාකූල වී ඇත. එබැවින්, ඔවුන් සේවක භාරකාර අරමුදලෙහි ප්‍රධාන කාර්යයන් පැහැදිලිව සඳහන් කර නොමැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

මෙය සමාගම් පනතට අදාළ අභියෝගාත්මක ප්‍රශ්නයක් විය .

**(a)** මෙම කොටස මගින් සාංගමික ව්‍යවස්ථාවලිය, සමාගමේ අරමුණු, අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සහ යුතුකම්, සමාගමේ ආරවුල් සහ බේරුම්කරණය හරහා ඒවා විසඳීම යනාදිය පිළිබඳ විෂය දැනුම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. සමාගම් පනතේ 188, 17(3) වගන්තිවලට අනුකූලව අපේක්ෂකයින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයනු ඇතැයි අපේක්ෂා කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ බලාතික්‍රමණය පිළිබඳ මූලධර්මය බොහෝ අයදුම්කරුවන්ට අවබොධ කරගැනීමට අපහසු බව නිරීක්ෂණය විය.

**(b)** බොහොමයක් අයදුම්කරුවන්ට සමාගම් පනතේ අධ්‍යක්ෂවරුන්ගේ යුතුකම් පිළිබඳ දැනුමක් තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය.

### (A) කොටස

මෙම කොටස ගිවිසුම් නීතිය මත පදනම් විය.

**(a)** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අර්පණය අර්ථ දැක්වීම, අර්පණයක් සන්නිවේදනය කිරීමේ න්‍යායාත්මක පැතිකඩ පිළිබඳව නිවැරදිව පිළිතුරු ලබා දෙන ලදී.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා නිවැරදි පිළිතුරු ලබා දී තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ගිවිසුම් නීතිය තුළදී, තැපැල් න්‍යාය අදාල කරගන්නා ආකාරය හඳුනා ගත්හ.

**(c)** බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා නිවැරදි පිළිතුරු ලබා දී ඇත. ඇතැම් අයදුම්කරුවන් ප්‍රසිද්ධියට පත් කරන ලද ඒකපාර්ශ්වික ගිවිසුම්වලදී, ප්‍රතිග්‍රහණය සිදුවන්නේ එකී කාර්යයන් ඉටු කිරීමෙන් බව හඳුනාගෙන පිළිතුරු දී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### (B) කොටස

මෙම කොටස නියෝජ්‍යත්ව නීතිය මත පදනම්ව ඇත.

**(a)** බොහොමයක් අයදුම්කරුවන්ට නියෝජිතයෙකුගේ යුතුකම් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් තිබූ අතර ප්‍රශ්නයට හොඳින් පිළිතුරු සපයා ඇත.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර සතුටුදායක මට්ටමක පිළිතුරු සපයා ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්න පත්‍රයේ කාර්ය සාධනය යහපත් විය. බොහෝ අයදුම්කරුවන් මුළු ප්‍රශ්න පත්‍රයටම සාමාන්‍ය මට්ටමට වඩා ලකුණු ලබාගෙන ඇත. අඩු ලකුණු ලබාගෙන ඇති ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු ඉතා දිගු බව නිරීක්ෂණය විය. සාමාන්‍යයෙන් නිරීක්ෂණය වූයේ අයදුම්කරුවන් සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම වැඩි දැනුමක් ලබා ගත යුතු බවත් ප්‍රශ්න පත්‍රයේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් පිළිතුරු සැපයිය යුතු බවත්ය. තවත් නිරීක්ෂණයක් වන්නේ අයදුම්කරුවන් ප්‍රශ්නය පිළිතුරක් ලෙස නැවත ලිවීමට උත්සාහ කර තිබීමයි.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණුඃ**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -